# ඝන වස්තු හඳුනා ගනිමු



## 3 ශ්‍රේණිය

## ගණිතය

LIVEWORKSHEETS

පහත සඳහන් කවි කියවා නිවැරදි රූපය තෝරන්න.

සම මුහුණත් 2 ක් ඇතේ
වක්‍ර දාර 2 ක් ඇතේ
වක්‍ර පෘෂ්ඨයක්ද ඇතේ
නමින් සිලින්ඩරය වෙතේ.

මුහුණත් 6 කින් සැරසීලා
දාර 12 කින් වටවීලා
ශීර්ෂ 8 කින් හැඩවීලා
මම ඝනකාභය නම් වීලා.

මුහුණු 6 ක් මට තිබෙයි
දාර 12 කුත් තියෙයි
ශීර්ෂ 8 කුත් තියෙයි
මට කියන්නෙ ඝනකයයි


LIVEWORKSHEETS

ත්‍රිකෝණ හැඩ වූ මුහුණත් 4 ට
දාර 6 ක් වේ එක්වීලා
ශීර්ෂ හතරින් හැඩ වූ මා දැක
චතුස්තලය ලෙස නම් කෙරුණා.

දාර ඇත්තෙ නෑ
ශීර්ෂ මට නෑ
පෘෂ්ඨය බෝලයි
ගෝලය මම වෙමි.

LIVEWORKSHEETS


1.චතුස්තලය



2.ගෝලය




3.සිලින්ඩරය



4.ඝනකාභය



5.ඝනකය



LIVEWORKSHEETS